සන්නස

Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
www.sannasa.com
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241after 4pm

සංස්කරණය / Editor
අසෝක සුබසිංහ
Asoka Subasinghe

සංස්කරණ උපදේශක / Editorial Advisor
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

සහය සංස්කාරක / Asst. Editor
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක / Sports Editor
අසෝක සිල්වා Asoka Silva

රූ රචා / Graphics
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

වෙළඳ දැන්වීම් / Advertising
S Jayasinghe
03 8707 4604
0402 025 516
email- sannasanews@gmail.com

Kuma Gamage
0414 215 280
email kuma.sannasa@gmail.com

Account Details for Payments

Account Name	- Sannasa Media
Bank	- Commonwealth
BSB Number	- 063619
Account Number	- 10852409

සන්නස පිරිවර
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

ඡායා රූ / Photography
Prasanna Kurukularatna

සම්බන්ධීකරණය

NSW
Lakshman Kodituwakku

QLD
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

ACT
Asoka Nimalasiri
0400 429 031

SA
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

ආදරය නොහඳුනන මිනිස්සු

අද සමාජය පැහැදිලිවම විකෘතියකට ලක්වී ඇතැයි අපට සිතෙයි. අද බොහෝ තරුණ තරුණියන් ආදරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇත්තන් නොවන බව අද සිදුවන සිදුවීම් පෙන්වා දෙයි.

ආදරය හඳුනන මිනිසකුට තමා මුලු හදවතින් ආදරය කරන පෙම්වතියට පිහියෙන් අතන කපා කොටා මරා දැමිය හැකිද? තමන් හැරදා ගිය පෙම්වතාට ඇසිඩ් ගසන්නට තියම ආදරයක් ඇති පෙම්වතියකට කළ හැකි හැකිද? මෙවන් සිදුවීම් කියක් නම් මාසයකට අපට අසන්නට ලැබෙනවාද? මෙවන් මිලෙච්ඡ තත්වයකට සමාජය පරිවර්තනය වූයේ ඇයි.?

සමාජ විද්‍යාඥයන් විසින් වඩාත් ගැඹුරට සොයා බැලිය යුතු මේ ප්‍රශ්නයේ ආරම්භය දැක්ක ගණනාවක් අතීතට විහිදෙන්නේ යයි අපට සිතෙයි. "සාහිත්‍යය කන්නද" යි අසමින් සාහිත්‍යය අපේ විෂය ධාරාවෙන් ඉවත් කළේ ජේ ආර් ජයවර්ධන ජනාධිපති උතුමාණන්ය. ඒ තාක් කාලයක් අපහසුවෙන් හෝ ගුරුවරුන්ගේ බලපෑම හා මග පෙන්වීම නිසා සෞන්දර්යය හඳුනාගන්නට වෙහෙසෙමින් සිටි පරපුරක් සෞන්දර්යයනේ ඇත්වීමේ ආරම්භය එතැනය. එතැන් සිට බිහිවෙමින් ආ පරපුර ඉතා පැහැදිලි ලෙසම සාහිත්‍ය පොත පතින් ඈත් වූ පරපුරකි. නවකතාවක් කවියක් කෙටිකතාවක් නොකියවූ උපාධිධාරීහු ශ්‍රී ලංකාවේ අනන්තවත් සිටිති. ඉදින් අපේ තරුණ පරපුර සෞන්දර්යය හඳුනන්නේ කෙසේද? සෞන්දර්යය නොහඳුනන හදවත් තුළ ඉතිරිවන්නේ මිලේච්ඡත්වය පමණකි.

ප්‍රේමයේ විප්‍රයෝගය විඳගනිමින් ජීවිතකයට මුහුණ දෙන්නට අපේ තරුණ තරුණියන්ට අද හැකියාවක් නැත. ඔවුහු විප්‍රයෝගය විඳගන්නේ එයට මිලෙච්ඡත්වය ආරෝපනය කරගනිමිනි. "උඹ මට නොලැබේ නම් වෙන කිසිවකුට අයිති වීමට ඉඩ නොදෙමි" වැනි අතිශය ආත්මාර්ථකාමී හයංකාර අදහස් පහළවන්නේ විප්‍රයෝගය විඳගන්නට නොදන්නා හදවත්වලය.

අද තරුණ තරුණියෝ පෙම් හසුනක් ලියන්නට නොදනිති. අද ඇත්තේ එස්එම්එස් පෙම් බැඳුමිය. තාක්ෂණය විසින් සියල්ල යාන්ත්‍රිකරණය කරනු ලැබ ඇත. ඉතාම සරල උදාහරණයක් ගනු කැමැත්තෙමු. "බුදු සරණයි" වැනි අතිශය හෘදයාංගම පැතුමක් අද BS යන අකුරු දෙක බව පත් වී ඇත. BS කියවන කෙනෙකුගේ හිතේ බුදු සරණ යාමක් ගැන අදහසක් පහළවෙයිද?

බුදු දහමින් පෝෂිත ජාතියක් මෙවන් මිලෙච්ඡ තත්වයට පත්වීමේ වගකීම කා අත වුවද මෙය වහ වහා පිළියම් කළ යුතු තත්වයකි. හුදු ප්‍රදර්ශනකාමී ආගම් ඇදැහීමෙන් ඔබ්බට ගොස් සැබෑ මානව දයාවෙන් හදවත් පුරවාලන ජීවිතය දෙස උපේක්ෂාවෙන් බැලිය හැකි පරපුරක් බිහිකිරීමේ උත්සාහය අපේ ආගමික්ස්ථාන තුළින් ආරම්භ විය යුතුය. ඒ සඳහා තරුණ මනස සූදානම් කළ යුතුය. සෞන්දර්යය ඔවුන්ගේ සිත් තුළට කා වැදදිය යුතුය. ඒ සඳහා ඔවුන් වඩ වඩාත් නිර්මාණශීලී පොත පත කෙරෙහි යොමු කළ යුතුය විප්‍රයෝගය වැනි වේදනාවක් විඳ දරා ගන්නට තරම් ගැඹුරක් ඇති හදවත් නිර්මාණය කළ යුතුය. විරහව ආධ්‍යාත්මිකව විඳ ගන්නට හැකි ශක්තිමත් මිනිසුන් ඉතිකළ යුතුය.

මෙය එක රැයකින් කළ හැකි දෙයක් නොවේ. එයා දශක ගණනාවක් තුළ ක්‍රමිකව බිහිවිය යුතු දෙයකි. ඒ සඳහා කළ හැකි දේ අපමණය. කළ යුතු දේ අපමණය.

සෞන්දර්යවාදී මිනිසුන් සමාජයට ආහරණයකි. ඔවුහු සමාජයට වෛර නොකරති. සමාජය දෙස ආදරයෙන් බලති. එවන් සමාජයක් පිළිබඳ අදහස සිහිනයක් පමණක් නොවන්නට වග බලාගැනීම සැමගේම යුතුකමයි.

සංස්කාරක

විමල්ගේ අඩව්ව ජනාධිපතිවරණයක දෙවැනි ඡන්දය වෙනුවෙන්ද?

ළහිරු සමරසිංහ

ජනතා විමුක්ති පෙරමුණෙන් වෙන්වූ නැත් සිට පුරා සත්වසරටකට ආසන්න කාලයක් ජනාධිපති සෙවනේ සමාධිගතව හුන් විමල් වීරවංශ මහතා දැන් අළුත් අඩවුවකට ප්‍රවේශවී සිටී. ඒ ආර්ථික ඝාතකයකුගෙන් රට බේරා ගැනීමේ ශාන්ති කර්මයටයි. මේ ශාන්ති කර්මයෙන් ඔහු පළවාහැරීමට බලාපොරොත්තු වන ප්‍රේතයා පී. බී. ජයසුන්දරයි. පහුගිය දින කිහිපයේ ඔහුගේ හඬ තැලිල්ලේ කියවුණේ, තවදුරටත් ඔහුට ආණ්ඩුවේ සිටිය නොහැකි එකම හේතුව පුංචි බණ්ඩා බවයි.

ආර්ථික ඝාතක පුංචි බණ්ඩාට එරෙහිව අවි අමෝරන විමල්, පසුගිය වකවානුවේ කළ කී දෑ මොහොතක් මෙනෙහි කරමු. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික සාරය කෙල පීඩක් සේ එළියට දමමින් හිතෙන තරම් කාලයක් ජනාධිපතිවී සිටීමට වරම් ලද 18 වන සංශෝදනයට විමල් උඩින්ම මාතාප වුණි. එය උඩින්ම සාධාරණය කෙරිණි. අධිකරණයේ ස්වාධීනතාව සතේකට මායිම් නොකළ ගිරාණි බණ්ඩාරනායක දෝශාභියෝගයේදී ඔහු නඩු කාරයෙක් විය. කධානායක, හලාවත, රතුපස්වල ආණ්ඩුවේ සෘජු මැදිහත්වීමෙන් සිදුකළ මිනිස් ඝාතනවලදී මරාදැමූ ජනතාවම වරදකරුවන් කළ මරණ පරීක්ෂක ඔහුය. විශ්‍රාම වැටුප්, ත්‍රස්තවිරෝධී පනත්, පුද්ගලික විශ්වවිද්‍යාල, ආචාර්යවරුන්ගේ වර්ජන, ශිෂ්‍ය ගැටළු ආදී කප්පරක් ප්‍රශ්නවලදී ඔහු කීවේ හතරවරං බයිලාම පමණි.

ඒත් දැං විමල්ට කැසිනෝ අරහංය. පීබීව අපළය. ආණ්ඩුව අවුල්ය.

මේ අවුල් ගොඩ නිසාම ආණ්ඩුවෙන් එළියට බසින්නට තමන් සූදානම් බව කියන්නේය.

සැබවින්ම විමල් ආණ්ඩුවෙන් එළියට බැස්සොත් කුමක් සිදුවේවිද? ඉදිරි වර්ෂයේ මැතිවරණ සිතියම හා ඔහුගේ භූමිකාව ගලපා බැලුවහොත් එහි බලපෑම පාර්ශව දෙකකකට අදාළය. එකක් රාජපක්ෂ ආණ්ඩුවය. අනෙක විමල්ය. විමල් ආණ්ඩුවේ සිටියත් නැතත් බයිලා හැර ජනතවෙට ලැබෙන වෙන කොංගෙඩියක් නොමැති නිසා මින් ජනතාවට සිදුවෙන බලපෑම ගැන සිතා බැලිය යුතු නැත.

2005 වසරේ සිට රාජපක්ෂ ආණ්ඩුව දුවන්නේ සිංහල බෞද්ධ අසහාතයේ ආනුභවයෙනි. ලංකාවේ සිංහල බෞද්ධයින්ට බඩට නොකෑවත් කබල් ගෑමට

4 වන පිටට